# ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ සුභ පැතුම් පණිවිඩය



සමෘද්ධිමත් කෘෂි ආර්ථිකයක් බිහිකරලීමේ නිරන්තර උත්සාහයක නිරත වන කෘෂිකර්ම අමාත්‍යාංශය ඒ සඳහා ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ආරම්භ කළේය. එහිදී තුන් අවුරුදු ආහාර නිෂ්පාදන සැලසුම් අනුව රටේ ආහාර නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමුව ඇත. දිවයිනේ සෑම ප්‍රදේශයක්ම, දිස්ත්‍රික්කයක්ම සහ පළාතක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන වෙනුවෙන් ප්‍රමුඛ දායකත්වය ලබාදීමට හැකිවීම වත්මන් කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙස මා ලද අනගි අවස්ථාවකි. මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සහ සාර්ථකව ක්‍රියාත්මක වෙතැයි මා තුළ දැඩි විශ්වාසයක් පවතින අතර ඒ සඳහා හදවතින්ම සුබ පැතුම් එක්කරමි.

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යනු එක් පාර්ශවයකට පමණක් සිදු කළ හැකි දෙයක් නොවේ. සියලුම පළාත් මෙම වැඩසටහන සඳහා උපරිම දායකත්වය සැපයිය යුතුය. සෑම පාර්ශවයක් විසින්ම කළ යුතු කාර්යයන් නිසියාකාරව ඉටු කිරීම තුළ පමණක් මෙහි සාර්ථකත්වය රැඳී පවතියි.

මෙම තුන් අවුරුදු සැලැස්ම අනුව වඩාත් ක්‍රමානුකූලව වගා කටයුතු සිදු කළ යුතුය. ඒ ඒ පළාත්වල පවතින පාරිසරික සාධක මත පිහිටා පසට ගැලපෙන බෝගය හඳුනාගෙන වගා සැලැස්ම ක්‍රියාත්මක කිරීම වැදගත්ය. මෙම සාමුහික ක්‍රියාවලියේ දී ජාතික ඉලක්ක ජය ගැනීමට නම් පළාත් අතර නිවැරදි සන්නිවේදනයක් තුළින් අන්‍යයෝන්‍ය අවබෝධය වර්ධනය කර ගත යුතුය.

රටේ ජනතාවගේ පරිභෝජනය සඳහා අවශ්‍ය ආහාර රට තුළම නිෂ්පාදනය කරමින්, කෘෂි ආර්ථිකය සවිබල ගන්වන ගොවි ප්‍රජාවගේ අතමිට සරු කරමින් කෘෂිකර්ම අංශය දියුණු කිරීමට ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ඉවහල් වනු ඇත. ඒ සඳහා දිවයිනේ සෑම පළාතක්ම ස්වකීය වගකීම නොපිරිහෙලා ඉටු කරනු ඇතැයි මම අපේක්ෂා කරමි. සීමා මායිම් පසෙකලා එකම අරමුණක් වෙනුවෙන් අප සැම එක්වන්නේ නම්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අපේක්ෂාව සඵල වනු නිසැකය.

දුමින්ද දිසානායක (පා.ම)
කෘෂිකර්ම අමාත්‍ය

# කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



දූපත් රාජ්‍යයක් වන අප විශිෂ්ඨ ගණයේලා සම්පත්වලට හිමිකම් කියන අතර ඉන් එක් සම්පතක් ලෙස කෘෂිකර්මාන්තය හැඳින්විය හැක. ග්‍රාමීය ජනතාවගෙන් 65% ක් පමණ කෘෂි ආර්ථිකයකට අයිතිවාසිකම් කියන අතර ඔවුන්ගේ දිවි පැවැත්ම කෘෂිකර්මාන්තය සමඟ බැඳී පවතී. තවද කාර්මික විප්ලවයත් සමඟ ලෝකයේ බොහෝ රටවල් නොයෙකුත් යාන්ත්‍රික කර්මාන්තවලට යොමු වීමත් සමඟ කෘෂිකර්මාන්තයට වූ අවධානය අඩු විණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් විවිධ කතිකා ගෝලීය වශයෙන් ඇති කිරීමටත් විවිධ සම්මුතීන් ගෝලීය වශයෙන් ගෙන ඒමටත් සිදු විණි. අප ඉදිරියේ එලෙස පවතින ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අවධානම අවම මට්ටමක පවත්වා ගෙන යාම සඳහා ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක ඇමතිතුමාගේත්, ජනාධිපති කාර්යාලය සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ජාතික ආහාර නිෂ්පාදන තුන් අවුරුදු සැලැස්ම එළි දක්වන ලදී. මෙහි මුඛ්‍ය පරමාර්ථය වූයේ අප මිහිතලය තුල ස්වයංපෝෂිත ලෙස නිෂ්පාදනය කළ හැකි ආහාර බෝග වගා කිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම, යටිතල පහසුකම්, බීජ, පොහොර වැනි අංග ලබා දෙමින් ගොවි ජනතාව සමඟ කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන එක් කර ගනිමින් 2018 වන විට මිරිස්, බී ලූණු, අල, මුං ඇට වැනි තෝරා ගත් මූලික බෝග ලැයිස්තුවකින් රට ස්වයංපෝෂිත කරවීමය. මෙම කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ධෛර්යය සහ ශක්තිය සමස්ථ ගොවි ජනතාවටත් සියලුම නිලධාරීන්ටත් ලැබේවායි පතමි.

වසන්ත අලුවිහාරේ (පා.ම)
කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය

# සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ පණිවිඩය



කෘෂිකර්මාන්තයට අවශ්‍ය ප්‍රධාන සාධක සියල්ලෙන් සමන්විත සාරවත් භූමියකට හිමිකම් කියන අප මව්බිමේ වගා කළ හැකි සෑම බිම් අඟලක්ම වගා කිරීම මඟින් අප රටේ ආහාර සුරක්ෂිතතාවය ආරක්ෂා කර ගනිමින් මෙන්ම අප රටේ කෘෂි පාරිසරික පද්ධතිය රැක ගනිමින් කෘෂි පාරිසරික කලාප පදනම් කරගත් ආහාර නිෂ්පාදන වැඩසටහන දියත් කිරීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන් මගේ සුභ පැතුම පිරිනමන අතර ජාතික ආහාර නිෂ්පාදනය සඳහා වන ඉලක්ක සාමූහිකව සාක්ෂාත් කර ගැනීම සඳහා රටේ සියළුම පළාත් වල දායකත්වය ලබා ගැනීමට කටයුතු කිරීම ඉතා වැදගත් බව අවධාරණය කරනු කැමැත්තෙමි.

මිලියන 22 ක පමණ ශ්‍රී ලාංකික ජනතාවගේ ආහාර අවශ්‍යතාවය සැපයීම සඳහා මෙරටට ආනයනය කරනු ලබන ආහාර සඳහා වාර්ෂිකව වැයවන රුපියල් බිලියන 100කට වැඩි විශාල විදේශ විනිමය රට තුළ ඉතිරිකර ගැනීම සඳහාත් ආහාර නිෂ්පාදනයේදී රසායනික පොහොර හා පළිබෝධනාශක භාවිතය අවම කොට පරිසර හිතකාමී ක්‍රම අනුගමනය කිරීම මඟින් රට තුළ ගුණාත්මක ආහාර ද්‍රව්‍ය සුලභ කිරීම සඳහාත් අතිරේක ආහාර සංචිත විධිමත්ව කළමනාකරණය කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහාත් මෙම වැඩසටහන ඉවහල් වේයැයි මා උදක්ම බලාපොරොත්තු වෙමි.

ඉදිරි තුන් අවුරුදු කාලය තුළ ආහාර නිෂ්පාදනයට අවශ්‍ය සියළුම ඉලක්කයන් ජය ගැනීම සඳහා රටේ සියළුම ජනතාව සංග්‍රාමයක් ජයගැනීමට කටයුතු කරන අයුරින් දැඩි කැපවීමෙන් හා වගකීමෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරන අතර ඒ සඳහා සබරගමු පළාතේ සියළු කෘෂිකාර්මික සම්පත් සහ යෙදවුම්ද නිලධාරීන්ගේ හා ගොවි ජනතාවගේ උපරිම කැපවීම හා දායකත්වයද ලබා දීමට කටයුතු කරන අතර ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන සාර්ථකවේවායි ශුභ ප්‍රාර්ථනා කරමි.

......................................

මහීපාල හේරත්,

ප්‍රධාන අමාත්‍ය, සබරගමුව පළාත.

# සබරගමුව පළාත් කෘෂිකර්ම අමාත්‍යතුමාගේ පණිවිඩය



ආහාර නිෂ්පාදන ජාතික වැඩ සටහන 2016 - 2018 සාර්ථක කර ගැනීම වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් සකස් කරනු ලබන වාර්තාවට පණිවිඩයක් ලබාදීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව එක සිතින් සතුටු වෙමි. අතිගරු ජනාධිපතිතුමාගේත් කෘෂිකර්ම අමාත්‍යතුමාගේත් කැපවීම මත රටේ කෘෂිකාර්මික චිරස්ථිතිය වෙනුවෙන් දියත් කරන ලද යථෝක්ත වැඩසටහන ඉතාමත් කාලෝචිත වැඩ සටහනක් බව පළමුව සඳහන් කරනු කැමැත්තෙමි. ඒ අනුව ඉතාමත්ම ක්‍රමවත් සැලැස්මක් යටතේ ග්‍රාමීය ගෙවත්ත දක්වා ඒ ඒ මට්ටමින් කෘෂිකාර්මික වගාවක් ජනතාව තුළ ප්‍රචලිත කිරීමට ගන්නා උත්සහය මඟින් ජනතාවගේ ගෘහ ආහාර අවශ්‍යතාවන් යම් පමණකට හෝ සපුරා ගැනීමට මෙමඟින් හැකිවනු ඇත. එසේම රටට ආහාර ආනයනය කිරීම වෙනුවෙන් වැයවන විශාල මුදල් සම්භාරය මෙරටෙහිම රඳවා ගැනීමට අදාල ඒ ඒ වගාවන් කෙරේ වැඩි අවධානයක් යොමුකිරීමද ඉතාමත් වැදගත් සාධනීය පියවරක් ලෙස දකිමි. යෝජිත සැලැස්ම පරිදි රටෙහි අවශ්‍යතාවය පදනම් කොටගෙන සැලසුම්කර ඇති කෘෂිකාර්මික සහ සත්ත්ව නිෂ්පාදන අංශයේ සංවර්ධනය ඇතිකර ගැනීම මඟින් පෝෂ්‍යදායී ආහාර සැපයීමට අවස්ථාව ලැබීමත්, ඒ ගැන ජනතාව තුළ උද්යෝගයක් ඇති කිරීමට කටයුතු කිරීම මඟින් කෘෂිකාර්මික වශයෙන් ධනාත්මක ප්‍රතිඵල ලබාගැනීමට හැකිවනු ඇත. ඒ අනුව ඉහත කී අරමුණු සාක්ෂාත් කර ගැනීමටත් එමඟින් කෘෂිකාර්මික ස්වයංපෝෂිතතාවය ඇතිකර ගැනීමටත් සියළු දෙනාටම හැකිවේවායි ඉත සිතින් මා ප්‍රාර්ථනා කරමි.

.................................

ශ්‍රී. ලාල් වික්‍රමසිංහ,

කෘෂිකර්ම අමාත්‍ය, සබරගමුව පළාත.

FOOD FIRST

**මම සම්පූර්ණයෙන්ම කාර්මීකරණයට සහයෝගය දක්වමි. වානේ කම්හල් වැනි දේ අගය කරමි. එහෙත් කිසියම් කර්මාන්තයකට වඩා කෘෂිකර්මය වැදගත්බව මම තරයේ කියා සිටිමි.**

**– ජවහල්ලාල් නේරු**

# පටුන

01. හැඳින්වීම ---------------------------------------- 1-2

02. පළාත් සිතියම ---------------------------------------- 3

03. පළාත් ඉලක්ක සාරාංශය ---------------------------------------- 4-5

04. කෑගල්ල දිස්ත්‍රික්ක ඉලක්කය ---------------------------------------- 6-24

05. රත්නපුර දිස්ත්‍රික්ක ඉලක්කය ---------------------------------------- 25-58